20 ධම්ම පදය II

20.1 කහවතට සුදුසු නුසුදුසු ඇත්තෝ

අගසවු සැරියුත් මුගලන් මහරහතන් වහන්සේලා දෙනම වරක් දහසක් භික්ෂූන් වහන්සේලා පිරිවරාගෙන රජගහ නුවරට වැඩම කළහ. නුවර වැස්සෝ වහා කණ්ඩායම්වලට බෙදී දන් පිළියෙල කොට පිළිගැන්වූහ. ඔවුනට අනුමෝදනාව කළ සැරියුත් මහ තෙරුන් වහන්සේ මෙසේ දනානිසංස වදාළහ.

'' උපාසකවරුනි, තමන් දන්දෙන නමුත් අනුන් ඊට අනුන් සම්මාදම් කර නොගන්නා අය ඒ පිනෙන් මතු භවභෝග සැප සම්පත් ලබති. එහෙත් පිරිවර සම්පත් නොලබති. තමන් දන් නොදී අනුන් සම්මාදන් කරවන අය මතු පිරිවර සම්පත් ලබති. භවභෝග සම්පත් නොලබති. තමනුත් දන් නොදෙන අනුනුත් සම්මාදම් නොකරවන අය කැඳවත් නොලබන, කාත් කවුරුත් නැති අසරණයන් ව උපදිති. තමනුත් දන්දෙන අනුනුත් ඊට සම්මාදන් කරගන්නා අය සියදහස් ගණන් ආත්මවල දී මහා භෝග සැප සම්පත් මෙන් ම මහා පිරිවර සම්පත් ද ලබති''.

මේ බණ අසා සිටි නුවණැති උපාසකයකුට මේ දෙයාකාර වූ ම සම්පත් ලබන පිනක් කරන්නට සිතුණි. හෙතෙම එදු ම ඒ දහස් නමට ම පසුදු දනට අරයුම් කළේය. අනතුරුව උපාසක තැන නුවර වීදියක් ගානේ යමින් කැමති කැමති අයට කැමති කැමති තරම් භික්ෂූන් වහන්සේලාට දන් දෙන්නට භාර දෙමින් සම්මාදම් කළේ ය. ඉතිරි භික්ෂූන් වහන්සේලාට දන්දීම තමා ම භාරගත්තේ ය. එදු ම සියලු දනෝපකාරණ එක් තැනකට රැස්කරගත් ඔවුහු දන් පිසන්නට වූහ.

මේ අතර තවත් කෙළඹියෙක් ලක්‍ෂයක් අගනා සුවඳ වස්ත්‍රයක් ගෙනවුත් දී '' මෙය විකොට අඩුපාඩු දෙයක් ගන්න, නැතිනම් සුදුසු තෙර නමකට පුදන්නැ '' යි කියා ගියේ ය. දනෝපකාරණවල අඩුවක් නොවූයෙන්

එම වස්ත්‍රය පුදන්නට තීරණය විය. පුදන්නේ කාටදැයි විමසීමේදී '' සැරියුත් තෙරුන්ට පුදමු''යි කෙනෙක් කීහ. තවත් කෙනෙක් සැරියුත් තෙරුන් මෙහි වඩින්නේ ඉඳහිට ය. එහෙත් අපේ මඟුල්, අවමඟුල් ආදී හැම දෙයකදී ම සිවුමංසලක පිංතාලියක් සේ අපට ඉන්නේ දෙවුදත් තෙරුන් ය. අපි මෙය උන්වහන්සේට පුදමුයි කීහ. අන්තිමේදී වැඩිදෙනාගේ කැමැත්තෙන් එය දෙවුදත් තෙරුන්ට පුදන ලදී.

උන්වහන්සේ ද එය කපා, මසා, පඬු පොවා පොරෙවාගෙන මහානුභාවයෙන් එහෙ මෙහෙ වඩිති. කෙසේ වුවත් මේ සිවුර නම් ගැළපෙන්නේ දෙව්දත් තෙරුන්ට නොව සැරියුත් තෙරුන්ට ම යැයි ජනයා දිගින් දිගට ම කියන්නට වූහ. රජගහ නුවරින් දෙවුරම් වෙහෙරට පැමිණි භික්ෂූන් වහන්සේ නමකගෙන් බුදුරදුන්ට මෙම පුවත සැළ විය. එහිදී උන්වහන්සේ '' මහණෙනි, දෙවුදතුන් තමන් සිවුරට නුසුදුසු ව සිටිමින් තමන්ට නොගැළපෙන සිවුරු පෙරවූයේ අද පමණක් නොවේ. පෙරත් එසේ කළේ '' යැයි හෙළිදරව් කරමින් ඡද්දන්ත ජාතකය වදාළ සේක.

එදා ඡද්දන්ත ඇතුන්ගේ රජවූයේ බෝසතාණන් වහන්සේ ය. දෙවුදත් දළ සඳහා ඇතුන් මරන්නෙක් වීය. මිනිසෙකුට වල් ඇතුන් මැරීම පහසු කටයුත්තක් නොවේ. එනිසා ඔහු සිටියේ ඒ සඳහා උපායක් සොයමිනි. ඒ වන-යේ පසේ බුදුරජාණන් වන්සේ නමක් වෙසෙති. උන් වහන්සේ දුටු තැන සියලු ඇත්තු දණ නමා නමස්කාර කර යනු මේ මිනිසා දුටුවේය. මේ අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නට සිතූ හෙතෙම පසේ බුදුරදුන් ස්නානය කරන වෙලාවක උන්වහන්සේගේ සිවුරක් සොරකම් කරගත්තේ ය. එය හිසේ සිට පොරවා ගත් හේ ඇතුන් යන එන මග මහ ගසක් මුල හුන්නේ ය. ඇතුන් පසේ බුදුරදුන් යැයි රැවටී ඔහු ළඟ දණ ගසා නමස්කාර කර යති. හෙතෙම සඟවා ගෙන සිටි අවියෙන් ගසා අන්තිමට ම යන ඇතු මරා දළ කපා ගෙන යයි.

ඇත් රැළ ක්‍රමයෙන් අඩුවන්නට විය. මෙයට හේතුව සෙවූ ඇත් රජුට රහස හෙළි විය. වේගයෙන් ඔහු වෙත පැන්න ඇත් රජු ඔහු එක් වර ම පාගා දමන්නට ගොස්, ආපසු හිත වෙනස් කරගෙන ඔහුට අවවාද කොට මුදා හළේ ය.

මෙසේ අතීත පුවත ගෙනහැර දැක්වූ බුදුරජාණන් වහන්සේ එදා දුන් ඒ අවවාදය ද ඇතුළත් කොට මේ ගාථා දෙක දේශනාකර වදාළහ.

> අනික්කසාවො කාසාවං
> යො වත්ථං පරිදහෙස්සති
> අපෙතො දම සච්චෙන
> න සො කාසාවමරහති.

ඇතුළත කෙලෙස් කසටින් කිළිටි ව, ඉඳුරන් දමනය කර නොගෙන වෙසෙන, සත්‍යවාදී නොවන තැනැත්තා කසාවත දරා සිටියත් කසාවතට සුදුස්සෙක් නොවේ.

> යො ච වන්තකසාවස්ස
> සීලෙසු සුසමාහිතො
> උපෙතො දම සච්චෙන
> ස වෙ කාසාවමරහති

කෙලෙස් කසට වමරා දැමූ, සතර සංවර සීලයෙහි මැනවින් හික්මුණු, ඉන්ද්‍රිය දමනයෙන් යුතු සත්‍යයෙහි පිහිටා සිටින උතුමා ඒකාන්තයෙන් ම කසාවතට සුදුස්සෙකි.

20.2 සරුයයි සිතා නිසරු දේ ම ගන්නෝ

රජගහනුවර අසබඩ උපතිස්ස කෝලිත නම් බමුණුගම් දෙකක් විය. ඒ ගම් දෙකේ ප්‍රධාන පවුල් දෙකෙහි උපන් වැඩිමහලු පුතුන් දෙදෙනා ද උපතිස්ස හා කෝලිත නම් වූහ. සසර එකට පෙරුම් පුරාගෙන පැමිණි මේ දෙදෙනා පණ වැනි මිතුරෝ ය. වරක් ගිරග්ග සමජ්ජ නම් සැණකෙළියක් බලන්නට ගිය මේ නුවණැති තරුණයෝ දෙදෙන '' අප මේ කරන්නේ කෙතරම් නිසරු බාල දේවල් ද'යි කියා කම් සැපයෙහි හොඳට ම කලකිරුණෝ ය. අමාරුවෙන් මව්පියන්ගෙන් අවසර ලබාගත් ඔවුහු සංජය බෙල්ලට්ඨිපුත්ත තුමා ළඟ පරිබ්‍රාජකයන් ලෙස පැවිදි වූහ.

එතුමාගේ ධර්මය සම්පූර්ණයෙන් ම ඉගෙන පුරුදු කළත් එය තමන් සොයන නිවන නොවන බව ඔවුන්ට වැටහිණි. එනිසා එතුමාගෙන් සමුගත්

ඔවුහු නැවතත් සත්‍ය සොයා ඇවිදින්නට වූහ. මෙවර දෙදෙනා ගියේ වෙන වෙනම ය. මෙසේ යන උපතිස්ස පිරිවැජියාට අස්සජි මහරහතන් වහන්සේ මුණ ගැසුණ, උන්වහන්සේ දුටු පමණින් ඔහුගේ සිත පහන් විය. වැඳ එකත් පස්ව සිටි පිරිවැජියා ඔබ වහන්සේගේ ගුරුවරයා කවරෙක් ද? එතුමාගේ දහම කුමක්දැයි විමසීය. ඊට පිළිතුරු දෙන අස්සජි තෙරණුවෝ,

'' පිරිවැජිය, අපගේ ශාස්තෘන්වහන්සේ ගෞතම බුදුරජාණන් වහන්සේ ය. නමුත් අලුත පැවිදි වූ බැවින් අප තව ම දන්නේ ස්වල්ප දහමක් පමණකැයි වදාළහ.

'' ස්වාමිනි, දන්නා තරමින් වදරනු මැනවි, එය සියදහස් නයින් අවබෝධකර ගැනීම අපට භාර යැයි උපතිස්ස පිරිවැජියා කීය. එවිට අස්සජි තෙරණුවෝඃ

'' හේතූන් ප්‍රත්‍යයන්ගෙන් හටගන්නා යම් දෙයක් වේද, ඒ දේ ඇති වීමේ හේතුව ද එය නැති වීමට හේතුව ද ඒ මහා ශ්‍රමණයන් වහන්සේ වදරන සේක. යනුවෙන් ප්‍රකාශ කළහ.

මෙය ඇසූ පමණින් උපතිස්ස පිරිවැජියා සෝවාන් විය. උන්වහන්සේ වැඳ සමුගෙන තම යහළුවා සොයා ගිය උපතිස්ස පිරිවැජියා මේ ආරංචිය ඔහුට ද පැවසී ය. ඔහු ද එම ප්‍රකාශය අසූ පමණින් සෝවාන් විය. අනතුරුව දෙදෙනා ම බුදුරදුන් වෙත යන්නට පිටත් වී පළමු කොට ගුරුවරයාගෙන් අවසර ගෙන යමුයි සංජය තුමා වෙත ගියෝ ය.

එතුමාට ආචාර කළ ඔවුහු '' ඇදුරුතුමනි, අපට නිවන් මග කියා දෙන කෙනෙකු හමුවිය. බුදුන්, දහම්, සඟුන් ලොව පහළවී ඇත. මේ සසර තවත් සැරිසැරීමෙන් ඇති ඵලය කුමක් ද? අපි කවුරුත් උන්වහන්සේ වෙත යමුයි ගුරුතුමාට ද යෝජනා කළෝය. එවිට ඇදුරුතුමා '' දරුවෙනි මෙතෙක් සැළියක් සේ සිටි මට කෙණෙස්සක් විය නොහැකි ය. ඔබ යන්න මම මෙහෙම ඉන්නම්' යැයි කීය.

උපතිස්ස කෝලිත පිරිවැජියන් දෙදෙනා බුදුරදුන් වෙත ගොස් පැවිදිව රහත් වූහ. **සාරිපුත්ත මොග්ගල්ලාන** යනුවෙන් මවුවරුන්ගේ නමින් ප්‍රසිද්ධ වූ උන්වහන්සේලා අගසවු තනතුර ද ලැබූහ. පසුව උන්වහන්සේලා තම ගුරුවරයා වූ සංජය තුමාගේ පුවත බුදුරජාණන් වහන්සේට සැළ කළහ.

එවිට උන්වහන්සේ ''මහණෙනි, සංජය තමාගේ මිසදිටු බව නිසා අසාර දෙය සාරය ලෙස ගත්තේ ය. සාරය අසාරය ලෙස අත්හළේ ය. ඔබ සසර මුහුකුරා ආ නුවණැති නිසා අසාරය අසාරය යයි අත්හැර, සාරය සාරය ලෙස ගත්තහු ය''යි වදරා මෙම ගාථා දෙක දේශනා කළ සේක.

අසාරෙ සාර මතිනො - සාරෙචාසාර දස්සිනො
තෙ සාරං නාධිගච්ඡන්ති - මිච්ඡා සංකප්ප ගොචරා

නිසරු දේ සරු යයි පිළිගෙන, සරු දේ නිසරු යයි දකින සුලු (කාම, ව්‍යාපාද, විහිසා යන) වැරදි කල්පනා ඇතියන්ට කිසිදක (සීල, සමාධි, ප්‍රඥා, විමුක්ති යන) සාර දේ නොලැබේ.

සාරං ච සාරතො ඤත්වා - අසාරං ච අසාරතො
තෙ සාරං අධි ගච්ඡන්ති - සම්මා සංකප්ප ගොචරා

සරු දේ සරු බව දැන, නිසරු දේ නිසරු බවත් දැන නිවැරදි කල්පනාවෙන් යුතු ව වෙසෙන තැනැත්තා සාරය ලබන්නේ ය.

20.3 වහලය හරිහැටි සෙවිලි කරගන්න

බුදුරදුන්ගේ සුළු මවගේ පුත් නන්ද කුමරු පැවිදි වුණේ කැමැත්තකින් නොවේ. ගතින් මහණ වුවත් උන්වහන්සේගේ සිත යන්නේ ම ගිහි ගෙදරට ය. එද කුමරුන් ඉක්මනින් එන්නැයි කී ජනපද කල්‍යාණියගේ වදන් නිතර දෙසවන රැව් පිළි රැව් දෙයි. රජකම ගැන සිතුවිලි සිතේ නිතර ම හොල්මන් කරයි. ඉවසිය නොහැකි තැන තමාට ගිහිගෙට යන්නට වුවමනා බව උන්වහන්සේ අනෙක් භික්ෂූන් වහන්සේලාට දැන්වූහ. මේ පුවත බුදුරජාණන් වන්සේට ද සැළවිය. උන්වහන්සේ නන්ද හිමියන් ගෙන්වා මේ කරුණ සැබෑදැයි ඇසූහ. '' සැබෑය'යි නන්ද හිමියෝ පැවසූහ.

නන්ද හිමියන්ගේ හිත හදන්නට උපක්‍රමයක් ගැන සිතූ බුදුරජාණන් වහන්සේ උන්වහන්සේ අතින් ගෙන තව්තිසා දෙව්ලොව බලා වැඩි සේක. එසේ වඩින අතර මග ද ගිය හේනක සිටි බාගෙට පිළිස්සී ගිය වැඳිරියක් ද නන්ද හිමියන්ට පෙනෙන්නට සැලැස්සූහ. තව්තිසා දෙව් ලොව දී පරෙවියන්ගේ බඳු රතු දෙපා ඇති දෙවඟනක් පෙන් වූ බුදුරජාණන් වහන්සේ ''නන්ද වඩා හොඳ ජනපද කල්‍යාණිය ද නැතහොත් මේ දෙවඟනන් දැ'යි ඇසූහ. ''ස්වාමිනී, මේ දෙවඟනන් හා සසඳන විට ජනපද කල්‍යාණිය අතරමගදී දුටු වැඳිරිය වැනියැ'යි නන්ද හිමියෝ කීහ. '' එසේ නම් නන්ද මම මේ දෙවඟනන් ලබා දෙන්නට පොරොන්දු වෙමි. හොඳින් මහණ දම් පුරන්නැයි' බුදුරජාණන් වහන්සේ වදාළහ. එයට එකඟ වූ නන්ද හිමියෝ ආපසු දෙව්රම් වෙහෙරට වැඩ ඉතා උනන්දුවෙන් මහණදම් පුරන්නට පටන් ගත්හ.

මේ ආරංචිය භික්ෂූන් වහන්සේලා අතර පැතිර ගියේ ය. ඇතැම් පුහුදුන් භික්ෂූන් වහන්සේලා බුදුරදුන්ගේ සුළුමවගේ පුත් නන්ද හිමියන් කුලියට මහණදම් පුරන්නේ යැයි උසුළු විසුළු කරන්නට වූහ. මෙයින් ලැජ්ජාවට පත් නන්ද හිමියෝ ගිහි ගෙදරට යන අදහස පසෙක ලා බවුන් වඩා රහත් වූහ. අනතුරු ව බුදුරදුන් වෙත ගිය නන්ද හිමියෝ තමාට දුන් පොරොන්දුවෙන් පලක් නැතැයි කීහ. '' නන්ද ඔබ රහත් වන විටම මම ඒ පොරොන්දුවෙන් මිදුණෙමි' යි බුදුරජාණන් වහන්සේ වදාළහ.

නන්ද හිමියන්ගේ මේ වෙනස් වීම ගැන භික්ෂූන් වහන්සේලාට තිබුණේ කුතුහලයකි. ඔවුහු උන්වහන්සේ රහත් වී යැයි නොසිතූහ. එනිසා මේ ගැන බුදුරජාණන් වහන්සේට සැළ කළහ. එවිට උන්වහන්සේ මහණෙනි, පසුගිය කාලයේ නන්ද හිමියන්ගේ සිත හරිහැටි සෙවිලි නොකළ වහලයක් වගෙයි තිබුණේ. දැන් එය හොඳින් සෙවිලි කළ වහලක් වගේය යයි වදරා මේ ගාථා දෙක දේශනා කළ සේක.

> යථාගාරං දුච්ඡන්නං
> වුට්ඨී සමති විජ්ඣති
> එවං අභාවිතං චිත්තං
> රාගො සමති විජ්ඣති

අතු දිරාගිය හෝ හරිහැටි සෙවිලි නොකළ වහලයේ සිදුරු අතරින්

වැසිදිය ගෙට වදින්නා සේම රාගය (ද්වේශය, මෝහය) දියුණු නොකළ සිත තුළට වදින්නේ ය.

යථාගාරං සුචඡනතං
වුටඨි න සමති විජ්ජති
එවං සුභාවිතං චිත්තං
රාගො න සමති විජ්ජති

මනාව සෙවිලි කළ වහලය විනිවිද වැසි දිය ගෙට නොවදින්නේ ය. එසේම රාගය (ද්වේෂය, මෝහය) මනාව දියුණුකළ සිත විනිවිද නොයන්නේ ය.

දම්සභා මණ්ඩපයට රැස් වූ භික්ෂූන් වහන්සේලා අතර නන්ද තෙරුන් හික්මවා ගැනීමට බුදුරජාණන් වහන්සේ යෙදූ අපූරු උපක්‍රමය ගැන කතා බහක් ඇති විය. එවෙලේ එහි වැඩි බුදුරජාණන් වහන්සේ '' මහණෙනි, අද පමණක් නොවේ පෙර ද මම මුන් වහන්සේ ස්ත්‍රියක් මගින් පොළඹවා ගෙන හික්මවා ගතිමි '' යි වදාරා **ගද්‍රභ ජාතකය** දේශනා කළ සේක.

20.4 තමාගේ කිළුටුකම් දැක තමාම ශෝක වීම

චුන්ද සූකරික රජගහනුවර, ඌරන් මරා මස් විකුණා දිවි ගෙවූවෙකි. හෙතෙම දුර්භික්ෂ කාලයට කරත්තයක වී පුරවාගෙන පිටිසර ගම්වල යයි. එහිදී වී නැළියට දෙකට ඌරු පැටවුන් ගෙන කරත්තය පුරවා ගෙනවුත් ඌරු කොටුවක දමා ඇති දැඩි කරයි.

ඌරන් හොඳින් වැඩී පුෂ්ටිමත් වූ පසු ඇඟමස් ඉදිමී ලේ සිඳෙන තුරු සතරැස් මුගුරකින් තලයි. අනතුරුව දණ්ඩකින් උගේ මුව අරවා කටාරමක කකාරවාගත් උණු දිය මුවට වත් කරයි. උගේ කුස පිරී ගිය උණු දියෙන් මල මූත්‍රා සියල්ල සේදී අධො මුඛයෙන් පිටවෙයි. මෙසේ උදරය සේදී පිරිසිදු දිය පිටවෙන තුරු ම උණු දිය වත් කරයි. ඉතිරි උණුදිය ඌරාගේ පිටට වත් කරයි. එයින් උගේ කළු සම ගැලවී යයි. අනතුරුව තණ හුලකින් ලොම් පුළුස්සා දමයි. අන්තිමේ දී තියුණු අවියකින් හිස සිඳ ඌරා මස්කොට ලේ වෙන ම බඳුනකට ගෙන ලේ වල තවර තවරා මස් විකුණයි. ගෙදර කෑමට ද ගනී.

මෙසේ වසර පනස් පහක් ගෙවී ගියේ ය. චුන්ද සූකරික වේළුවනාරාමය අසල ම සිටියත් කිසිදක මලක් පිදීම තරම්වත් පිනක් නොකළේ ය. කල්යාමේ දී ඔහුට නොයෙක් රුදුරු ආබාධ හට ගැනිණි. මෙලොවදී ම අවීචියේ ගින්නෙන් දැවෙන තරම් දැවිල්ලකින් ඔහු නිරතුරුව ම දැවෙන්නට විය. ඌරන්ට කළ වධ හිංසා ඒ ආකාරයෙන් ම පෙරළා ඔහු කරා පැමිණියේ ය. ඔහු ද ඌරෙකු මෙන් දණ ගාමින් ඌරු හඬලන්නට පටන් ගත්තේ ය. ගෙදර ඇත්තන් ඔහු පිටත යෑම වලක්වන්නට ගෙට දමා දොරගුළු ලා ඔහුගේ කට ද බැඳ තැබුවත් කර්ම විපාකය වලක්වන්නට හැකි නොවී ය. සත් දිනක් ඇවෑමෙන් ඔහු මිය ගොස් අවීචි මහ නරකාදියේ උපන්නේ ය.

අවසාන දිනවල ඒ ගෙය අසලින් වඩින භික්ෂූන් වහන්සේලාට ද නොකඩවා ම මේ මර ලතෝනිය ඇසුණි. කුමක් හෝ උත්සවයකට මස් සැපයීමට චුන්ද දිනපතා ඌරන් මරනවා විය යුතු යැයි උන්වහන්සේලා සිතුහ. මේ පුවත බුදුරජාණන් වහන්සේ සමග ද උන්වහන්සේලා පැවසූහ. එවිට බුදුරජාණන් වහන්සේ

'' මහණෙනි, මේ සත් දවසේ චුන්ද ඌරන් මැරුවේ නැත. මර බියෙන් ඌරෙකු මෙන් දිනපතා කෑගැසුවේ ඔහු ම ය. ඔහු දිගු කලක් තිස්සේ කළ කර්මයට අනුරූප විපාක මෙලොවදී ම ඔහුට පල දුන්නේ ය. අවීචි ගින්නේ දහය ඔහු ළඟට ම පැමිණියේ ය. අද හෙතෙම අවීචි මහ නරකයේ දුක් විඳී '' යයි වදරා මේ ගාථාව දේශනා කළ සේක.

ඉධ සොචති පෙච්ච සොචති
පාපකාරී උභයත්ථ සොචති
සො සොචති සො විහඤ්ඤති
දිස්වා කම්ම කිලිට්ඨමත්තනො

පව් කළ තැනැත්තා ජීවිතයේ අවසාන සමයේ තමා මෙතෙක් කළ කිළිටි පව්කම් දැක (මම පිනක් නොකළෙමි. පව්කම් කළෙමි යි) මෙලොවදී ම ශෝක වෙයි. (එය කර්ම ශෝචනාවයි) පරලොව දී ඒ පව්කම්වලට අනුරූප දුක් විපාක ලැබෙන විට හෙතම වඩාත් ශෝක වෙයි, වැලපෙයි, දුකින් හැපෙයි, (ඒ විපාක ශෝචනාවයි)